ආසාදනය



# හොරි
# Scabies

## වැදගත් කරුණු

- හොරි ඇතිවන්නේ පුද්ගලික පිරිසිදු කමේ දුර්වලතාවය නිසා නොවේ.
- රෝගයෙන් පෙලෙන කෙනෙකුගේ ආශ්‍රයෙන් බෝවේ.
- හොරි සෑදී ඇති කෙනෙකු ආශ්‍රය කළ පවුලේ සෑම කෙනෙක්ම එකම අවස්ථාවකදී ප්‍රථිකාර ලබා ගත යුතුයි.
- ප්‍රථිකාරය මුහුණේ සහ හිසේ සම හැර ශරීරයේ සෑම තැනම ආලේපය කර පසුදා සෝදා හැරිය යුතුය. මෙම කාලය තුලදී අත් සේදුවේ නම් ප්‍රථිකාරය නැවත අත්වලට ලබා දිය යුතුය.
- හොරි **mite** (කිනිතුල්ලා වැනි කුඩා සත්ව වර්ගයක්) සඳහා ප්‍රමාණවත් ප්‍රථිකාරයෙන් පසුව පළු හෝ කැසිල්ල තැන්පත් වීමට සති 2-3 ගතවේ.
- මුලික ප්‍රථිකාරයෙන් පසුව දරුවන්ට පාසැළට යා හැක.

## එවා මොනවාද?

හොරි, මිනිසාගේ සම මතුපිට තට්ටුවේ ජීවත්වී බෝ වන mite නම් කිනිතුල්ලා වැනි ඉතා කුඩා සත්ව වර්ගයක් හේතුකොට ගෙන සම කැසීමෙන් හට ගනී. Mite ජීවත්වන්නේ මිනිස් සම මත පමණි. Mite සමහර සතුන් මත බහුලව ගැවසෙතත් එම සත්ව mite වර්ගය මිනිසා කෙරෙහි බලපන්නේ කලාතුරකිනි. හොරි විශාල ලෙස පැතිරෙන කැසීම සහ රතුවට, ( සුදු පැහැති සමේ රතුවටත්, වර්ණවත් සමේ දම් හෝ දිඹුරු පාටටත් ) පළු ශරීරයේ සහ අත පයේ සෑදේ. සාමාන්‍යයෙන් එය හිසේ සහ බෙල්ලේ හට ගන්නේ නැත. කැසීම, රෑට සහ උෂ්ණයට උත්සන් නවේ. Mite, සම හාරයි. විශේෂයෙන් ඇඟිලි ආශ්‍රිතව, එමෙන්ම බාල දරුවන්ගේ අත් සහ පා වල. මෙම පදෙස් වල කුඩා බිබිලි ඇති වීමට ඉඩ තිබේ. Mites වැළිම්වේ, කිහිළි අවට, පුරුෂ ලිංගය මත, අණ්ඩ කෝශය සහ තන පුඩු පදෙසේද දැකිය හැක. මෙයට භාජනයවු මිනිසුන් සමේ mite වලට නුරුස්සීමේ ගතියක් (allergy) ඇති කර ගනී. එවිට ඔවුනට විශාල ලෙස පැතිරෙන කැසීම සහ නුරුස්සීමේ පළු ඇතිවේ.

## එය පැතිරෙන්නේ කෙසේද?

හොරි පොදු වශයෙන් අන් අයට පැතිර යන්නේ ආසාදිත (infected) තැනැත්තකු හා සමග ඇතිවන සමීප ආශ්‍රය හේතුවෙන්ය. උදාහරණයක් වශයෙන් ඔවුන්ගේ අත් අල්ලා ගෙන සිටීම. බොහෝ විට එය පවුලේ එක් අයෙකුගෙන් තවත් කෙනෙකුට බෝ විය හැක. පොදු වශයෙන් එකට සෙල්ලම් කරණ දරුවන් එකි නෙකාට බෝ කරයි. හොරි ඇතිවන්නේ පුද්ගලික පිරිසිදු කමේ දුර්වලතාවය නිසා නොවේ. හොරි mite ට මනුෂ්‍ය ශරීරයෙන් තොර ජීවත්විය නොහැක. එබැවින් එය කාර්පට් එකෙන් හෝ ගෘහ භාණ්ඩ වලින් අල්ලා ගත නොහැක.

## එය වළක්වා ගත හැක්කේ කෙසේද?

හොරි සෑදුනු කෙනෙකුගේ පවුලේ සෑම කෙනෙක්ම සහ සමීපව ඇසුරු කළ අය හොරි ඇති හෝ නැති බවට පෙනුනත් ප්‍රථිකාර ලබා දිය යුතුයි. රෝගය වැළදී ඇති සහ සෙසු ඇසුරු කළ අය යන දෙපාර්ශවයටම ප්‍රථිකාර කිරීම එය පැතිරීම වළක්වා ගත ගැකි ඉතාම වැදගත් සාධකයයි.

## ඊට ප්‍රථිකාර කළ හැක්කේ කෙසේද?

බොහෝ අයට සම මතු පිට ආලේපය කළ හැකි ක්‍රීම් හෝ බෙහෙත් වතුරකින් ප්‍රථිකාර කළ හැක. එයින් ජීවී mite නසා දැමිය හැක. ඉතාම සුදුසු ප්‍රථිකාරය සඳහා වෛද්‍ය වරයකු ගේ උපදෙස් ලබා ගත යුතුය. ක්‍රීමය හෝ බෙහෙත් වතුර, හක්කේ සීමාවේ සිට පාදයේ ඇඟිලි අක්වා අත්වලට සහ විශේෂයෙන් රහස් අංග අවට හැකුළුනු තැන්වලට

# Singhalese - Scabies

සමීපව ආලේප කළ යුතුයි. එය  පැය 24ක් රඳවා තබාගෙන පසුදා සෝදා හරින්න. මෙම කාලය අතර තුර අත් සේදුවේනම් නැවත ක්‍රීම් හෝ බෙත් වතුර ආලේප කරන්න.

ළඟින් ඇසිරු කල සියලුම නිවැසියන් එකම අවස්ථාවේදම ප්‍රථිකාර ලබා ගත යුතුය. පසුගිය දින කීපය ඇතුලත පාවිච්චි කරණ ලද සියලුම ඇඳුම් සහ පථිකාර ලබාගත් දින රාත්‍රී පාවිච්චි කරණ ලද ඇඳ ඇතිරිලි සියල්ලමද සෝදා පිරිසිදු කර ගත යුතුය. Mite මරා දැම්ම සඳහා සාමාන්‍ය රෙදි සෝදන ද්‍රව්‍ය යොදා උණු වතුයෙන් සේදීම ප්‍රමාණවත්ය. ඇතැම්විට දෙවන ප්‍රථිකාරයක් නිර්දේශ කරණු ඇත.

ප්‍රථිකාරය ලබාගෙන අවසන්වුවිට කැසීමේ පළු බැස යාමට සති 2–3 කාලයක් ගතවේ. හොරි නිසා ඇතිවන කැසීම සහ චර්මදාහය dermatitis පාලනය කිරීම සඳහා වෛද්‍යවරයා cortisone ක්‍රීම් වර්ගය නියම කරණු ඇත. මූලික ප්‍රථිකාරයෙන් පසුව ළමයින්ට පාසැල් යා හැක.

## වැඩිපුර තොරතුරු

ඔබේ මාතෘ සහ ළමා සෞඛ්‍ය හෙදිය
ඔබේ ඖෂධ වේදියා
ඔබේ පවුලේ දොස්තර මයා/මිය
චර්ම රෝග විශේෂඥයෙක් (A dermatologist)

© 2002, Department of Dermatology, St. Vincent's Hospital Melbourne, Victoria Parade, Fitzroy, Victoria 3065 Australia.